museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2024 අප්‍රේල්

## MMCA ශ්‍රී ලංකා පන්ති කාමරයට කලාව එකතු කරයි

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) රට පුරා ඇති විවිධ කණ්ඩායම් අරමුණු කරගත් අධ්‍යාපන මුලපිරීම්වලට විශේෂ අවධානයක් යොමු කරයි. මේවාට පොදු ජනතාව, පාසල්, හා උසස් අධ්‍යාපන ආයතන ඇතුළත් වේ.

MMCA ශ්‍රී ලංකා, එහි පාසල් හා උසස් අධ්‍යාපන ආයතන ව්‍යාප්ති වැඩසටහන තුළින් එයට ආසන්න කිලෝමීටර 10 අරය තුළ පිහිටි පෙර පාසල්, පාසල්, හා උසස් අධ්‍යාපන ආයතන මෙන් ම කලාව හා සංස්කෘතිය පිළිබඳව අධ්‍යාපනික උනන්දුවක් දක්වන ආයතන සමඟ නියැලේ. කෞතුකාගාරයේ ප්‍රදර්ශන, කලාකෘති, තේමා, හා ප්‍රකාශන, පන්ති කාමරවලට ඇතුළත් කිරීමට කැමති අධ්‍යාපන ආයතනවලට පැවරුම් හා විෂයමාලා නිර්මාණය කිරීම සම්බන්ධව මඟ පෙන්වන සංචාර, ක්‍රියාකාරකම්, විශේෂයෙන් නිර්මාණය කළ වැඩමුළු හා අතිරේක සහය (ආරාධිත දේශන වැනි දේ) ලබා දෙනු ලැබේ.

MMCA ශ්‍රී ලංකාහි ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා සඳහන් කළේ, “අපගේ ව්‍යාප්ති ක්‍රියාකාරකම් නිර්මාණය කර තියෙන්නේ කෞතුකාගාරයක් යනු අප්‍රාණික දේවල් ඇති සමාධියක් හෝ වියුක්ත අදහස්වලින් යුක්ත ප්‍රභූ, ප්‍රවේශ විය නොහැකි ස්ථානයක් යන මතය පහ කිරීමටයි” යනුවෙනි. ඇය තව දුරටත් කියා සිටියේ, “කාලයත් සමඟ, රටේ සිසු ජනගහන ශ්‍රී ලාංකික නූතන හා සමකාලීන කලාවේ අනාගතය හැඩ ගැස්වීමට හා නිර්මාණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයින්, අරමුදල් සපයන්නන්, විද්වතුන්, තීරණ ගන්නන්, සහ නිර්මාණශීලී නායකයින් ලෙස පැමිණේවි. ඔවුන් අපගේ අනාගතයේ කේන්ද්‍රයේ සිටින අතර, එය ව්‍යාප්ති හා ඉගෙනීම් වටා අප අද කරන කාර්යය සමඟ පටන් ගන්නවා” යනුවෙනි.

MMCA ශ්‍රී ලංකා ප්‍රධාන ආකාර දෙකක් හරහා අධ්‍යාපන ආයතන සමඟ නියැලේ. එහි පළමුවැන්න, කෞතුකාගාරයේ සංදර්ශිත ප්‍රදර්ශනයක් නැරඹීමට එන ව්‍යාප්ති සංචාරයක් ය. මඟපෙන්වන සංචාරයක් හා ඉල්ලීම මත සිදු කරන ක්‍රියාකාරකමක්, පැවරුමක්, හෝ ආයතනයේ කැමැත්ත පදනම් කරගත් ආවර්ජනාවක්/සාකච්ඡාවක් ඇතුළත් ඉගෙනීම් අත්දැකීමක් එකතුවූ සංචාරයක් ලබා දීමට කෞතුකාගාරයේ අධ්‍යාපන හා අභිරක්ෂණ කණ්ඩායම් එක්ව කටයුතු කරයි. කෞතුකාගාරයේ ප්‍රදර්ශන අවකාශ විචල්‍ය ආකාරයෙන් නිර්මාණය කර ඇති අතර ඒවා පන්තිකාමර සහ/හෝ විවේචනාත්මක විග්‍රහ සැසි පැවැත්වීමට හැකි අවකාශ බවට පරිවර්තනය කළ හැක.

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

2024 අප්‍රේල් වන විට, MMCA ශ්‍රී ලංකා පෙරපාසල්, රාජ්‍ය, ජාත්‍යන්තර, හා අර්ධ රාජ්‍ය පාසල් සහ, රාජ්‍ය සහ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් 3,000 පමණ සංචාර අභිරක්ෂණය  කර සංවිධානය කර ඇත.

MMCA ශ්‍රී ලංකාහි අධ්‍යාපනය හා පොදු වැඩසටහන් සහය අභිරක්ෂක ප්‍රමෝධා වීරසේකර පැවසුවේ, "කෞතුකාගාරය නිර්මාණ කර තිබෙන්නේ ඉගෙනීම් හා අධ්‍යාපන අත්දැකීම් සඳහායි. සිසුන් අප සමඟ සම්බන්ධවී අපගේ ප්‍රදර්ශන හා ශ්‍රී ලංකාවේ නූතන හා සමකාලීන කලාව වටා ඇති කතිකාවට හා සංවාදයට දායක වීම පිළිබඳව අප ඉතා සතුටට පත් වෙනවා" යනුවෙනි. "මෙම ව්‍යාප්ති වැඩසටහන තවත් පුළුල් කිරීම හා විධිමත් අධ්‍යාපන අංශයේ අත්‍යවශ්‍ය වෙනස්කම් සඳහා අපට දායක විය හැකි ආකාරය ගැන සිතීම, අපගේ විශාල අරමුණක් වෙනවා" යැයි ඇය වැඩිදුරටත් පැවසුවා ය.

අධ්‍යාපන ආයතන සමග නියැලීමේ දෙවන ක්‍රමය ලෙස, MMCA ශ්‍රී ලංකාහි කාර්ය මණ්ඩල සාමාජිකයින් අධ්‍යාපන ආයතන වෙත යයි. මෙම චාරිකාවලදී ඔවුන් කෞතුකාගාරය, එහි උත්සාහ, ශ්‍රී ලාංකික නූතන හා සමකාලීන කලාව, හා වර්තමානයේ සංදර්ශිත ප්‍රදර්ශනයක තේමා පිළිබඳව කතා කරයි. එක් එක් අධ්‍යාපන ආයතනවල ප්‍රමුඛතා සහ ඒවා ශ්‍රී ලාංකික නූතන හා සමකාලීන කලාවේ සංදර්ශනය, පර්යේෂණය, එකතුව, හා සංරක්ෂණය යන කෞතුකාගාරයේ මෙහෙවර සමඟ ගැලපෙන ආකාරය පදනම් කරගෙන කෞතුකාගාරය මෙවැනි සංචාර අභිරක්ෂණය කරයි. 2024 අප්‍රේල් වන විට කෞතුකාගාරයේ කාර්ය මණ්ඩලය කොළඹ ඕවර්සීස් පාසල, ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලය, හා කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි දෙපාර්තුමේන්තුව වෙත ගොස් ඇත.

ව්‍යාප්ති සංචාරයක් ඉල්ලුම් කිරීමට education@mmca-srilanka.org තුලින් MMCA ශ්‍රී ලංකාව සමඟ සම්බන්ධ වෙන ලෙස අධ්‍යාපන ආයතනවලින් (විධිමත් සහ අවිධිමත්) ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය  (MMCA ශ්‍රී ලංකා) යනු සාමාන්‍ය ජනතාව, පාසල්, මෙන් ම සංචාරකයන්ගේ ද ප්‍රයෝජනය හා රසවින්දනය සඳහා නූතන සහ සමකාලීන කලා කෘති ප්‍රදර්ශනය, පර්යේෂණය, රැස්කිරීම, සහ සංරක්ෂණය වෙනුවෙන් කැප වූ පොදු කෞතුකාගාරයක් පිහිටුවීම අරමුණු කරගත් අධ්‍යාපනය පෙරටුකරගත්  මුලපිරීමකි. කෞතුකාගාරය දිනපතා (පෝය සහ මහජන නිවාඩු දිනවල හැර) පෙ.ව. 10–ප.ව. 6 දක්වා කොළඹ 03, ක්‍රෙස්කැට් බූලෙවාර්ඩ්හි බිම් මහලේ විවෘතව ඇති අතර, කෞතුකාගාරයට ඇතුළුවීම සහ එහි සියලු ම මහජන වැඩසටහන් නොමිලේ ය. කෞතුකාගාරය සහ, එහි ප්‍රදර්ශන හා මහජන වැඩසටහන් පිළිබඳ තොරතුරු ඔවුන්ගේ වෙබ් අඩවියෙන් www.mmca-srilanka.org/ හෝ ෆේස්බුක් facebook.com/mmcasrilanka සහ ඉන්ස්ටග්‍රෑම් instagram.com/mmcasrilanka/ පිටුවලින් ලබාගත හැක.